සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 9 - 2019

නම : ............................................. විද්‍යාව කාලය : පැය 02 යි.

## I කොටස

සැළකිය යුතුයි :

I සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න. වඩාත් ම නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

---

(1) පහත දැක්වෙන ක්ෂුද්‍ර ජීවීන් අතරින් බහුසෛලික ක්ෂුද්‍ර ජීවියෙකු වීමට වඩාත්ම ඉඩ ඇත්තේ

(1) වයිරස ය. (2) දිලීර ය. (3) බැක්ටීරියා ය. (4) එවුග්ලීනා ය.

(2) මිනිස් කනට දරාගත හැකි ශබ්ද තරංග පරාසය වනුයේ,

(1) 2 Hz - 20 Hz (2) 20 Hz - 200 Hz (3) 20 Hz - 20000 Hz (4) 200 Hz - 20000 Hz

(3) සහල් වලින් දහයියා ඉවත් කිරීම සහ වැලි ඉවත් කිරීම සඳහා යොදාගත හැකි ක්‍රම වන්නේ,

(1) පෙලීම සහ ගැරීම (2) වාෂ්පීකරණය සහ පෙලීම

(3) ගැරීම සහ භාගික ආසවනය (4) ස්ඵටිකීකරණය සහ වාෂ්පීකරණය

(4) බලය දෛශික රාශියක් ලෙස සැලකීමට හේතුව පහත පිළිතුරු අතරින් කුමක් ද?

(1) බලයට ක්‍රියාකරන රේඛාවක් සහ උපයෝගී ලක්ෂ්‍යයක් තිබීමයි.

(2) උපයෝගී ලක්ෂ්‍යයක් සහ දිශාවක් තිබීමයි.

(3) විශාලත්වයක් සහ උපයෝගී ලක්ෂ්‍යයක් තිබීමයි.

(4) විශාලත්වයක් සහ දිශාවක් තිබීමයි.

(5) A පිහියක් හොඳින් මුවහත් කිරීම

B බර වාහනවලට වැඩි රෝද ගණනක් යෙදීම

C පාසල් පොත් බෑගයක කරපටිය වඩාත් පළලට යෙදීම

D ක්‍රීඩකයන්ගේ සපත්තුවල පතුලේ ඇණ යෙදීම

ඉහත ප්‍රකාශ අතරින් පීඩනය අවම කර ගැනීමට යොදා ගෙන ඇති පියවර සහිත පිළිතුර වන්නේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි.

(3) B හා C පමණි. (4) A, B හා D පමණි.

(6) පුප්පුසීය මහා ධමනිය නම් රුධිර නාලය සම්බන්ධ වන මිනිස් හෘදයේ කුටීරය වනුයේ,

(1) දකුණු කර්ණිකාව ය. (2) දකුණු කෝෂිකාව ය.

(3) වම් කර්ණිකාව ය. (4) වම් කෝෂිකාව ය.

(7) ශාක වර්ධක ද්‍රව්‍යවල බලපෑම නිසා ඇති වන තත්ත්වයක් නොවන්නේ,

(1) පොහොර හිඟවීම නිසා ශාක පත්‍ර කහපැහැ වීම.

(2) ශාක කඳ ආලෝකය දෙසට නැවීම.

(3) ශාකයක අග්‍රස්ථ අංකුරය ඉවත් කළ පසු පාර්ශ්වික අංකුර ඉක්මනින් වැඩීම.

(4) රසායන ද්‍රව්‍ය යෙදූ පසු පළතුරු ඉක්මනින් ඉදීම.



LIVEWORKSHEETS

(8) චලනය සඳහා ව්‍යාජ පාද සහ අවල්පත් යොදා ගන්නා සතුන් අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) ඇමීබා සහ පැරමීසියම් (2) එවුග්ලීනා සහ කැස්බෑවා

(3) කැස්බෑවා සහ ඇමීබා (4) ඇමීබා සහ කැස්බෑවා

(9) පහත දැක්වෙන මතයන් අතරින් පෘථිවියේ සම්භවය පිළිබඳව වඩාත්ම පිළිගැනීමට ලක්ව ඇති මතය වනුයේ,

(1) මහා පිපිරුම් වාදය (2) විශේෂ මැවුම් වාදය

(3) කොස්මොසොයික් වාදය (4) ස්වයංසිද්ධජනන වාදය

(10) යකඩ මුදුවක් මත තඹ (කොපර්) ආලේප කිරීමේදී නිවැරදි සම්බන්ධය දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) යකඩ මුදුව ධන අග්‍රයට සම්බන්ධ කළ යුතුය.

(2) යකඩ මුදුව ඍණ අග්‍රයට සම්බන්ධ කළ යුතුය.

(3) ඍණ අග්‍රයට සම්බන්ධ කළ යුත්තේ තඹ කැබැල්ලකි.

(4) ධන අග්‍රයට මිශ්‍රලෝහ කැබැල්ලක් යෙදිය යුතුය.

(11) දොඩම් යුෂ ද්‍රාවණයක දොඩම් ඇට පාවෙන අවස්ථාව තෝරන්න.

(1) දොඩම් යුෂ මිරිකූ අවස්ථාවේදී ම

(2) දොඩම් යුෂයට ජලය දැමූ අවස්ථාවේ දී

(3) දොඩම් යුෂයට සීනි හැඳි කීපයක් දැමූ අවස්ථාවේ දී

(4) දොඩම් යුෂයට ලුණු ද්‍රාවණයෙන් බිංදුවක් දැමූ අවස්ථාවේ දී

(12) පොළෝ තලය මත ජෛව විවිධත්වය සැලකීමේදී ජෛව විවිධත්ව උණුසුම් කලාපයක් (Hot spots) ලෙස හඳුන්වන්නේ,

(1) පොළවේ උෂ්ණත්වය වැඩි ප්‍රදේශයකි. (2) ජීවීන් ඉක්මනින්ම වඳවී යන ප්‍රදේශයකි.

(3) දේශගුණික විපර්යාස බහුල ප්‍රදේශයකි. (4) සාපේක්ෂව ජෛව ඝනත්වය අධික ප්‍රදේශයකි.

(13) හරිතාගාර වායු විමෝචනය වළක්වන හෝ අවම දායකත්වයක් දෙන පරිදි තනන ලද ගොඩනැගිල්ල හරිත ගොඩනැගිල්ලක් (Green building) ලෙස හැඳින්වේ. එය නිර්මාණයේ දී සැළකිය යුතු කරුණක් වන්නේ,




(1) අවම ශාක වැස්මක් තිබීම (2) නඩත්තු පිරිවැය අවම කරන නිවාස සැළසුමක්වීම.

(3) විදුලි ආලෝකය උපරිමව ලබාදීම (4) අපද්‍රව්‍ය ප්‍රමාණය උපරිම වන පරිදි කළමණාකරණය.

(14) සමාන්තර ආලෝක කදම්බයකින් විසාරී පරාවර්තනයක් සිදුවන පෘෂ්ඨය කුමක් ද?

(1)  (2) 

(3)  (4) 

(15)   

ඉහත දක්වා ඇති සරල යන්ත්‍ර අනුපිළිවෙළට දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) චක්‍රය සහ අක්ෂ දණ්ඩ, කප්පිය, ලීවරය (2) ලීවරය, චක්‍රය සහ අක්ෂ දණ්ඩ, කප්පිය

(3) කප්පිය, ලීවරය, ආනතතලය (4) ආනත තලය, චක්‍රය සහ අක්ෂ දණ්ඩ, කප්පිය



LIVEWORKSHEETS

(16) ලෝටස් ආවරණය (Lotus effect) වඩාත්ම හොඳින් පැහැදිලි කරන පිළිතුර කුමක් ද?

(1) ජල අංශුව නැනෝ පරිමානයෙන් සැකසී තිබීම

(2) පත්‍ර මතුපිට ආරෝපන ඇති බැවින් ජලය විකර්ෂණය වීම

(3) පත්‍ර මතුපිට නැනෝ පරිමාණයෙන් අංශුවල සියුම් සැකසුම

(4) තෙල් වැනි ද්‍රව්‍යයක් පත්‍ර මතුපිට තිබීම.

(17) විවෘත භූමියක සිටින අයෙකු අකුණු අනතුරකින් ආරක්ෂා වීමට කළයුතු නිවැරදි ක්‍රමෝපාය හා ඊට ගැළපෙන හේතුව දක්වා ඇති පිළිතුර වනුයේ,

| | ක්‍රමෝපාය | හේතුව |
|---|---|---|
| 1. | ගලක් වැනි පරිවාරක ද්‍රව්‍යයක් මත සිටගැනීම | පරිවාරක නිසා විදුලිය ගමන් නොකරයි |
| 2. | ගසක් හෝ කණුවක් අසලට යාම | අකුණ ගමන් කිරීමට මාධ්‍යයක් තිබීම |
| 3. | ජංගම දුරකථනය ඉවත් කිරීම | ආරෝපණ වලට අකුණු ආකර්ශණය වීම |
| 4. | පොළව මත වාඩිවීම හෝ දිගාවීම | උස අඩුවීම |

(18) ගෝලීය උණුසුම ඉහළයාම වැළැක්වීමට ගත <u>**නොහැකි**</u> ක්‍රියා මාර්ගය වන්නේ,

(1) වන වගාව සහ වන සංරක්ෂණය

(2) බහු භාණ්ඩ පරිහරණයෙන් මිදී සරල ජීවන රටාවකට හුරුවීම.

(3) වැඩිපුර විදුලිය භාවිතයට ගැනීම

(4) පොදු ප්‍රවාහන මාධ්‍යය බහුලව යොදා ගැනීම.

(19) දුව භාවිතය සම්බන්ධ <u>**අසත්‍ය**</u> වගන්තිය තෝරන්න.

(1) ස්වභාවික ප්‍රතිචක්‍රීකරණය වන පැරණිතම ඉදිකිරීම් ද්‍රව්‍ය දුව වේ.

(2) කළුවර, බුරුත, කළුමැදිරිය වැනි වටිනා දුව තෙත් කලාපයේ දී බහුලවම දකිය හැක.

(3) කල්පැවැත්ම, වයිරම, වර්ණය, දුව සතුව පවතින විශේෂ ලක්ෂණ කීපයකි.

(4) දුවවල පහසුවෙන් දිරා යන්නේ එලය තුළ අඩංගු ආහාර වේයන් සහ ගුල්ලන් ආහාර ලෙස ගැනීමෙනි.

(20) A අල්පාම්ලික ජලය විද්‍යුත් විච්ඡේදනයෙන් කැතෝඩය අසලින් හයිඩ්‍රජන් වායුව පිටවේ.

B රන් ආලේපයට විද්‍යුත් විච්ඡේද්‍යය ලෙස ගෝල්ඩ් සයනයිඩ් යොදා ගනී.

C කොපර් සල්ෆේට් විද්‍යුත් විච්ඡේදනයෙන් ඇනෝඩය මත තඹ ආලේප කළ හැකිය.

මෙම ප්‍රකාශ අතරින් සත්‍යය වන්නේ,

(1) A හා B පමණි (2) A හා C පමණි

(3) B හා C පමණි (4) A B C සියල්ලම

(ලකුණු 20 x 2 = 40)



LIVEWORKSHEETS